# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1946/10 - 2015 දෙසැම්බර් මස 22 වැනි අඟහරුවාදා - 2015.12.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 24/51 (x).

**(203 වැනි අධිකාරය වූ) මෝටර් වාහන පනත**

(203 වැනි අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 213ඈ වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 237 වැනි වගන්තිය යටතේ ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍ය.

2015 දෙසැම්බර් මස 07 වැනි දින.
කොළඹ දී ය.

නියෝග

2011 ඔක්තෝබර් මස 5 වැනි දිනැති අංක 1726/12 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද, 2011 අංක 4 දරන මෝටර් වාහන (ත්‍යාග සහ දිරි දීමනා අරමුදල) නියෝග එහි 2(1) නියෝගය ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් කොටස ආදේශ කිරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

"2. (1) (මෙහි මින්මතු "පනත" යනුවෙන් සඳහන් කරනු ලබන) (203 වැනි අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 213ඈ වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ ත්‍යාග සහ දිරි දීමනා අරමුදල පහත දැක්වෙන තැනැත්තන්ගෙන් සමන්විත වන පාලක මණ්ඩලයක් විසින් කළමනාකරණය කිරීම සහ පරිපාලනය කිරීම කළ යුතු ය :-

(*අ*) පාලක මණ්ඩලයේ සභාපතිවරයා විය යුතු වූ මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්වරයා ;

(*ආ*) මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා (පරිපාලන) ;

(*ඇ*) මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන මූල්‍ය නිලධාරියා ;

(*ඈ*) ප්‍රවාහන විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නම් කරනු ලබන ප්‍රවාහන අමාත්‍යාංශයේ නියෝජිතයකු ;

(*ඉ*) භාණ්ඩාගාර ලේකම්වරයා විසින් නම් කරනු ලබන භාණ්ඩාගාර නියෝජිතයකු.".

01 - 385


1A - PG 2737 — 506 (2015/12) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*